# ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපය ආශ්‍රිත ව වාසය කළ ප්‍රාග් ඓතිහාසික මධ්‍යශිලා මානවයාගේ යැපුම් අර්ථ ක්‍රමය

## (කිතුල්ගල බෙලිලෙනෙහි වර්තමාන පරිසරය ආශ්‍රිත ව ජීවත්වන සත්ත්ව ප්‍රජාව ඇසුරින්)

නිසංසලා ජිනසේන[7]

දේශගුණික ලක්ෂණ අනුව ශ්‍රී ලංකාව තෙත් වියළි සහ අන්තර් මධ්‍යම වශයෙන් කලාප ත්‍රිත්වයකට බෙදේ. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික අවධියට අයත් මධ්‍යශිලා මානව වාසස්ථාන ගණනාවක් තෙත් කලාපය ආශ්‍රිත ව විසිරී පවතී. මෙම පර්යේෂණය කෑගල්ල දිස්ත්‍රික්කයේ යටියන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කිතුල්ගල ග්‍රාමයේ පිහිටි ප්‍රාග් ඓතිහාසික බෙලිලෙන ලෙන මත පදනම් විය. මේ යුගයේ මානවයා සරල දිවි පෙවෙතක් ගෙවූ අතර දෛනික යැපීම් ක්‍රමය තුළ ශාක හා සත්ත්ව ආහාර මූලික විය. ක්ෂේත්‍ර ආශ්‍රිත ව හඳුනාගෙන ඇති ගවරා, කුළුමීමා, ඌරා, ගෝනා, මීමින්නා, ඉත්තෑවා, හාවා, වලිකුකුළා, හබන්කුකුළා, වඳුරා, අකාවුස් වර්ගයේ ගස් ගොළුබෙල්ලන්, මුහුදු බෙල්ලන් ආදී සහ වෙනත් සත්ත්ව, උරග, මත්ස්‍යයින්ගේ සත්ත්ව අවශේෂ අනුව සත්ත්ව ආහාර සඳහා වැඩි නැඹුරුතාවක් දක්වා ඇති බව උපකල්පනය කළ හැකි ය. අතීත මානවයා විසින් ස්වකීය ආහාරයට එක්කොට ගෙන වර්තමානය වන විට ශේෂ ව පවතින සත්ත්ව සාධක සහ වර්තමාන පරිසර පද්ධතිය ආශ්‍රිත ව ජීවත්වන සත්ත්ව විශේෂ හඳුනාගැනීම තුළින් අතීත පාරිසරික කාලගුණික තත්ත්වය වර්තමානය වන විට යම් වෙනස්වීමකට ලක් වී පවතී ද, වර්තමාන පාරිසරික කාලගුණික සාධක කෙතරම් දුරට ප්‍රාග් මානවයාගේ යැපුම් අර්ථ ක්‍රමය ප්‍රතිනිර්මාණය කිරීම කෙරෙහි දායක කරගත හැකි ද යනා දී තොරතුරු අනාවරණය කර ගැනීමට මෙම පර්යේෂණය කොතෙක් දුරට බලපානවාද යන්න විමසිය යුතු ය. මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍ර පරිශීලනය සහ ක්ෂේත්‍ර ගවේෂණ යන ක්‍රමවේදයන් භාවිතා කරනු ලැබුණි. ප්‍රාග් ඓතිහාසික යුගය සම්බන්ධයෙන් දේශීය වශයෙන් සිදු කරන ලද පර්යේෂණ අනුව සමස්ත සාධක මත මධ්‍යශිලා මානව සංස්කෘතිය ප්‍රතිනිර්මාණය කර ඇත. පහතරට තෙත් කලාපීය කිතුල්ගල බෙලිලෙන ආශ්‍රිත ගැඹුරින් බලංගොඩ මානවයාගේ යැපීම් අර්ථ ක්‍රමය පිළිබඳ ව ප්‍රාග් ඓතිහාසික යුගයට අදාල ව විවරණය කර ඇති ද වර්තමාන පරිසරය හා සන්සන්දනාත්මක ප්‍රවේශයක් එම ක්ෂුද්‍ර ක්ෂේත්‍රයට අදාල ව සිදුකර නොමැත. කැණීම් ආශ්‍රිත ව හඳුනාගත් සත්ත්ව ප්‍රජාව වර්තමාන පරිසරයෙහි ජීවත්වේ ද පාරිසරික හා කාලගුණික වෙනස්වීමක් පවතී ද හඳුනාගැනීම වැදගත් වේ. බෙලිලෙන ආශ්‍රිත වර්තමාන පාරිසරික සාධක අනුව පැහැදිලි වන කරුණක් වන්නේ වර්තමානය වන විට අතීතයේ පැවති තෙත් කලාපීය පාරිසරික තත්ත්වය යම් ප්‍රමාණයකට වෙනස් වීම හේතු කරගෙන අතීත පාරිසරික තත්ත්වය යටතේ ජීවත් වූ සතුන් වර්තමානය වනවිට අඩු වීමක් දක්නට හැකි බව ය. තෙත් කලාපීය ලක්ෂණ අනුව එම පරිසරය තුළ ලේනා, දඬුලේනා, ඉත්තෑවා, හම්බාවා, වලිකුකුළා, ඌරුමීයා, රිලවා, අකාවුස් රෙසියෝලාබීආටුස් ගස් ගොළුබෙල්ලන් ආදී කුඩා සතුන් බහුල ව හඳුනාගත හැකි අතර ඇතැම් සතුන් සම්පූර්ණයෙන් ම වඳවී ගොස් ඇත. එමෙන් ම මෙම කලාපය ආශ්‍රිත ව සමශීත උෂ්ණ දේශගුණික තත්ත්වයක් පෙන්නුම් කරන බවට හඳුනාගත හැකි ය.

ප්‍රමුඛ පදඃ මධ්‍යශිලා යුගය හා බෙලිලෙන, යැපීම් අර්ථ ක්‍රමය, සත්ත්ව අවශේෂ.

[7] පුරාවිද්‍යා හා උරුම කළමණාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.